**සැලසිනේ රූපවාහිනී ආයතනය - 2019**

**----------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

සැලසිනේ රූපවාහිනී ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**------------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

| අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂා කරන තත්ත්වයන් ඉහත දී කළ ඇස්තමේන්තු වලින් වෙනස් වන්නේ නම් එම වෙනස/වෙනස්කම් ශ්‍රී.ලං.රා.අ.ගි.ප්‍ර.3 -"ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි" ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු පිරිවැය රු.15,272,938 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | දේපල, පිරියත හා උපකරණ අවශේෂ වටිකාකම් නිවැරදි කිරීම සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | ගිණුම් ප්‍රමිත අනුව කටයුතු කළ යුතු බව. |

### 1.5.2 ගිණුම්කරන අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව ගෙවිය යුතුව පැවති රු.315,000 ක් වූ ගොඩනැගිලි කුලී උපචිත වියදමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. එම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වුණි. | ගොඩනැගිල්ලේ බදු කුලිය ගිණුම් ගත කිරීමට කටයුතු කරමින් පවතින අතර ඉදිරියේදී ගැටළු ඇති නොවීමට කටයුතු කෙරේ. | නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | නව නිරීක්ෂණය කිරීමක්ද/ පවත්නා නිරීක්ෂණයක්ද? | පාලන අවදානම් අනාවරණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | | | |
| සේවක ණය | 3,233,910 | 3,822,321 | 588,411 | නව නිරීක්ෂණයකි. | පද්ධතිය හඳුන්වාදිය යුතුය. | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | ශේෂයන්ට අදාල නිවැරදි උපලේඛන ඉදිරිපත් කළ යුතු බව. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) දේපල, පිරියත හා උපකරණ | රු.3,052,278 | විස්තරාත්මක උපලේඛන | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ශේෂයන්ට අදාලව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ) ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ | 82,109,385 | ණයගැති/ණයහිමි උපලේඛන, වයස් විශ්ලේෂණ සහ ශේෂ සනාථ කිරීම් | කළමනාකරණය විසින් අදහස් දක්වා නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ සඳහන් ශේෂයන්ට අදාලව විස්තරාත්මක උපලේඛන, වයස් විශ්ලේෂණ සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කළ යුතු බව. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 2 (1) (අ) වගන්තිය | යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අය කළ හැකි ආදායමක් ලබන තැනැත්තෙකු විසින් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද ගෙවනු ලැබිය යුතු වුවත්, 1982 පෙබරවාරි 01 දින ආරම්භ කර තිබූ සැලසිනේ රූපවාහිනී ආයතනය විසින් විගණන දිනය වන විටත් ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, ආයතනය විසින් ආසන්න වසර 3 ක, එනම් 2017, 2018 සහ 2019 වර්ෂවල පිළිවෙලින් රු.1,210,436 ක් රු.29,704,436 ක් සහ රු.8,300,209 ක් වශයෙන් ලාභ උපයා තිබුණි. | අප ආයතනය ආදායම් බදු ගෙවීමට බැඳී නොමැත. | පනත ප්‍රකාරව ආදායම් බදු ගෙවිය යුතු බව. |
| (ආ) 2014 ඔක්තෝබර් 15 දිනැති අංක DMS/1595 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය | (i) අදාල ලිපිය මඟින්, කොන්ත්‍රාත් පදනම මත තනතුරු 18 ක් අනුමත කර ඊට අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු බව සඳහන් කර තිබුණද කළමණාකරු (මූල්‍ය) තනතුර හැර අනෙකුත් තනතුරුවලට අදාලව බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.<br><br>(ii) උක්ත සඳහන් ලිපිය පරිදි, කොන්ත්‍රාත් පදනම මත අලෙවි විධායක තනතුරු 6 | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමට කටයුතු කෙරේ. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගෙන බඳවා ගැනීම් සිදු කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | ක් අනුමත කර, "සුදුසුකම් මත වැටුප තීරණය කළ යුතු හෙයින් තනතුරට අදාල බඳවා ගැනීමේ සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දැනුම් දීමට කටයුතු කරන ලෙස" දන්වා තිබුණද, අදාල තොරතුරු ඉදිරිපත් කර අනුමත කර ගැනීමෙන් තොරව එම තනතුරු වලට අදාලව වැටුප් ගෙවීමට කටයුතු කර තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමට කටයුතු කෙරේ. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගෙන බඳවා ගැනීම් සිදු කළ යුතු බව. |
| (ඈ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය | චක්‍රලේඛය ප්‍රකාරව, අවම වශයෙන් මාස තුනකට වරක් හෝ විගණන කළමණාකරන කමිටුව රැස්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | 2019 වර්ෂයේ වැඩි කාලයක් අභ්‍යන්තර විගණන අංශය අක්‍රියව පැවති බැවින් විගණන කමිටු රැස්වීම් පැවැත්විය නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.8,300,209 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 29,704,437 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.21,404,228 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට මෙහෙයුම් ආදායම රු.30,416,306 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් 51,848,535 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා ජාතික චිත්‍රපට සංස්ථාවට අයත් ගොඩනැඟිල්ලක් 2014 ජනවාරි 15 සිට 2019 ජනවාරි 14 දක්වා බදු පදනම මත ලබා ගෙන තිබුණද අදාල දිනයෙන් පසු ගොඩනැඟිල්ලෙන් ඉවත් වීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් ජාතික | මේ වන විට ආයතනය වෙනත් ගොඩනැඟිල්ලකට ගෙන ගොස් ඇති අතර ගොඩනැඟිල්ල චිත්‍රපට සංස්ථාවට භාර දීමට කටයුතු කරමින් පවතී. | අදාල මුදල් නිරවුල් කිරීමට සහ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු |

| | | | |
|---|---|---|---|
| | චිත්‍රපට සංස්ථාව විසින් ඊට අදාලව 2021 මාර්තු 12 දින එන්තරවාසියක් යොමුකර එදින සිට දින 14 ක් ඇතුළත ගොඩනැගිල්ලෙන් ඉවත් වන ලෙසද දන්වා තිබුණි. එසේ වුවද ගිවිසුම අළුත් කිරීමට හෝ නව ගිවිසුමකට එළඹීමට හෝ කටයුතු කර නොතිබු අතර විගණන දිනය වු 2021දෙසැම්බර් 30 දින වන විටත් අදාල ගොඩනැගිල්ලෙන් ඉවත් වීමට කටයුතු කර නොතිබුණි.<br><br>තවද, 2014,2017 සහ 2018 යන වර්ෂවලට අදාලව ජලය හා විදුලිය වියදම් වශයෙන් රු.758,764 ක මුදලක් ගෙවිය යුතුව ඇති බව ඉහත සඳහන් එන්තරවාසියේ දක්වා තිබුණද අදාල මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවලද හෙළදරව් කර නොතිබුණි. | | බව. |
| (ආ) | 2014 වර්ෂයේ දී හෙළිදරව් කර ගනු ලැබු ආයතනයේ සේවකයෙකු විසින් සිදු කරනු ලැබු මුදල් වංචාව සම්බන්ධයෙන් ලැබිය යුතු රු.11,988,000 ක මුදල වර්ෂ 05 ක් ගත වුවද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි | විමර්ශන කටයුතු මූල්‍ය අපරාධ විමර්ශන කොමිසන් සභාව විසින් අවසන් කර නඩු පැවරීම සඳහා නීතිපති උපදෙස් සඳහා යොමු කර ඇත. | අදාල මුදල් අය කර ගත යුතු බව. |

**3.2 මානව සම්පත් කළමණාකරනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 70 දෙනෙකු වු අතර ඉන් 31 දෙනෙකු ස්ථිර සේවකයන්ද 39 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයන්ද විය. එදිනට තත්‍ය කාර්ය මණ්ඩලය 67 ක් වු අතර ඉන් 15 දෙනෙකු ස්ථිර සහ 52 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබු සේවකයින් විය.ඒ අනුව, ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 21 ක් සහ අතිරික්තය 05 ක් වු අතර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබු කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 7 ක් සහ 20 ක අතිරික්තයක් පැවතුණි. | බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමෙන් පසුව කාර්ය මණ්ඩලය අනුමත ආකාරයෙන් පවත්වා ගැනීමට කටයුතු කරනු ඇත. | කාර්ය මණ්ඩලය අනුමත ආකාරයෙන් පවත්වා ගත යුතු බව. |